# තනතුරු - ඇබෑර්තු

## වැලිගම නගර සභාව

වැලිගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| 1. කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | රා. ප. ච. 3/2016 අනුව PL - 1 - 2016 වැටුප් කාණ්ඩයේ ආරම්භක පියවර රු. 24,250-10x250-10x270-10x330-12x330- රු. 36,410 | අ.පො.ස (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (2ක්) සහිතව විෂයන් හයක් (6ක්) සමත්ව තිබිය යුතුය. |
| 2. වැඩ ක්ෂේත්‍ර කම්කරු | 01 | රා. ප. ච. 3/2016 අනුව PL - 1 - 2016 වැටුප් කාණ්ඩයේ ආරම්භක පියවර රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම |
| 3. සෞඛ්‍ය කම්කරු | 05 | රා. ප. ච. 3/2016 අනුව PL - 1 - 2016 වැටුප් කාණ්ඩයේ ආරම්භක පියවර රු. 24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410 | 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම |

*පොදු සුදුසුකම් :*

I. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

II. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය අනුව අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර පදිංචිය සනාථ කර තිබිය යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

V. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

*සේවයේ නිරත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේ දී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

II. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර වසර 03ක පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම, හැසිරීම යහපත් තත්වයේ පවතින අයට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. වසර තුනක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

III. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද පළාත් සභා හා පළාත් රාජ්‍ය සේවයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් චක්‍රලේඛ හෝ රෙගුලාසිවලට හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට සියළුම සේවයකයන් බැඳී සිටී.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත 2018-04-27 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, වැලිගම නගර සභාව, වැලිගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය වැලිගම නගර සභාවේ ලේකම් සතු වේ.

අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය :

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතිකය,
3. පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය. (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තැබිය යුතුය,)
4. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,
5. පළපුරුද්ද පිළිබඳ සහිතකය.

චන්ද්‍රා අබේගුණවර්ධන,
ලේකම්,
වැලිගම නගර සභාව.

2018 මාර්තු මස 08 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

.................................................................................. තනතුර සඳහා අයදුම්පත

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) : ____________________.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම : ____________________.
3. තැපැල් ලිපිනය : ____________________.
4. දුරකථන අංකය : ____________________.
5. උපන් දිනය : ____________________.

   වර්ෂය : ________ මාසය : ________ දිනය : ________

6. ජාතික හැඳුනුම්පත් අංකය : ____________________.
7. අයදුම් පත් භාරගන්නා අවසාන දිනට වයස

   වර්ෂය : ________ මාසය : ________ දිනය : ________

8. ස්ත්‍රී/පුරුෂ භාවයඃ ____________________.

9. විවාහක/ අවිවාහක භාවය: ————————————.

10. ජාතිය: ————————————.

11. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග : ————————————.

12. අධ්‍යාපන සුදුසුකම්: ————————————.

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්: ————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙමගින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුර තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

දිනය : ————————.

————————————,
අයදුම්කරුගේ අත්සන.

03-1063